රෙජිස්ට්‍රාර් ජනරාල් චක්‍රලේඛ අංක : 01 / 2001

මගේ අංකය :- එම්/1/41/2001 වී.උ.ම.
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
340, ආර්.ඒ.ද.මැල් මාවත,
කොළඹ 03.
2001 ජූනි මස . 14. දින

සියලුම විවාහ රෙජිස්ට්‍රාර් වරුන් වෙත,

## විවාහ ලියාපදිංචි කිරීම.

ශ්‍රී ලංකාවේ විවාහයක් සිදුකිරීම සංස්කෘතිකමය වශයෙන් වැදගත් කමක් උසුලන අවස්ථාවක් වන අතර විවාහ දිවියට එළඹෙන නව යුවලගේ සුවිශේෂ අවස්ථාවක් ද වේ. එහෙත් මෙම සුවිශේෂ අවස්ථාවට උචිත වන ආකාරයට විවාහ ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු නොකරන බව මා වෙත වාර්තා වී තිබේ.

02. එබැවින් විවාහයක් සිදුකිරීමේ ඇති ගෞරවනීය බව රැකගැනීම පිණිස සහ රෙජිස්ට්‍රාර් ධූරයේ ඇති ගෞරවය ආරක්ෂා කිරීම පිණිස විවාහයක් සිදුකරන අවස්ථාවේ රෙජිස්ට්‍රාර් වරුන් විසින් පහත සඳහන් උපදෙස් පිළිපැදිය යුතු බව මෙයින් කරුණාවෙන් දන්වමි.

1. විවාහ සිදුකිරීමේදී රෙජිස්ට්‍රාර්වරුන් සම්පූර්ණ ඇඳුමකින් සැරසී සිටින්න.
   (පුරුෂයින් කරපියවූ අත්දිග ඇඳුමකින් ද, ස්ත්‍රීන් විනීත අන්දමින් සැකසුනු සාරියකින් හෝ ඔසරියකින් සැරසී සිටීම වඩාත් යෝග්‍යය)
2. විවාහයක් ලියාපදිංචි කිරීමට නියමිත වේලාවට අඩුම වශයෙන් විනාඩි 15 කටවත් පෙර නියමිත ස්ථානයට යන්න.
3. විවාහය සිදුකරන ස්ථානයේදී ඉතා විනීතව, ප්‍රසන්නව හා ගෞරවාන්විතව හැසිරෙන්න. මත්පැන් හා දුම්පානය නොකරන්න.
4. විවාහය සිදුකිරීමට පෙර විවාහ ලේඛණය මනාළ යුවලට පෙන්වා එහි වැරදි ඇතොත් නිවැරදි කරගන්න.
5. විවාහය සිදුකිරීමට පෙර සාක්ෂිකරුවන්ගේ විස්තර විමසා දැනගෙන එම විස්තර විවාහ ලේඛණයට ඇතුළත් කරන්න.
6. විවාහය සිදුකිරීමට පෙර විවාහ රෙජිස්ට්‍රාර් වරයා නැගී සිට මනාළ යුවලගෙන් හා සාක්ෂිකරුවන් ගෙන් ද නැගී සිටින ලෙස ඉල්ලා සිටින්න.

7. <u>විවාහය සිදුකිරීම (සාමාන්‍ය විවාහ නීතිය යටතේ)</u>

(i) ඇමුණුමෙහි දැක්වෙන 01 වන වගන්තිය ඔබ විසින් සියලු දෙනාටම ඇසෙන පරිදි පැහැදිලිව කියවන්න.

(ii) ඉන්පසු ඔබ විසින් ඇමුණුමෙහි දැක්වෙන 02 වන වගන්තිය පළමුවෙන් මනාලයා ලවාද ඉන්පසු මනාලිය ලවා ද කියවන්න.

(iii) ඉන්පසු ඇමුණුමෙහි දැක්වෙන 03 වන වගන්තිය පළමුවෙන් මනාලයා ලවා ද ඉන්පසු මනාලිය ලවා ද කියවන්න.

(iv) සියලුම වගන්ති කියවා අවසන් කළ පසු මනාල යුවළට සහ සාක්ෂිකරුවන්ට ද වාඩිවන ලෙස ඉල්ලා සිටින්න. ඔබද වාඩිවන්න.

(v) ඉන්පසු විවාහ ලේඛණයේ පිටපත් තුනේම නියමිත ස්ථානයන්හි පළමුවෙන් මනාලයාගේ ද දෙවනුව මනාලිය ගේ ද ඉන්පසු සාක්ෂිකරුවන්ගේ ද අත්සන් ලබාගන්න. එම ස්ථානයේදීම ඔබද විවාහ ලේඛනයේ නියමිත ස්ථානයන් හි අත්සන් තබන්න.

(vi) අත්සන් තබා අවසන් වූ පසු නැවතත් ඔබ නැගිට සිට මනාල යුවළගෙන් හා සාක්ෂිකරුවන්ගෙන් ද නැගී සිටින ලෙස ඉල්ලා සිටින්න.

(vii) ඉන්පසු අවශ්‍ය නම් කෙටි සුභ පැතිමක් කර විවාහ ලේඛනයේ තුන්වන පිටපත මනාලියට භාර දෙන්න.

8. <u>විවාහ සිදුකිරීම ( උඩරට විවාහ නීතිය යටතේ )</u>

ඉහත (7) වගන්තියේ (i) , (ii) සහ (iii) උප වගන්ති වෙනුවට පහත සඳහන් උපදෙස් පිළිපදින්න.

(i) මනාළයාට මනාලියගේ අතින් අල්ලා ගන්නා මෙන් ඉල්ලා සිටින්න.

(ii) ඉන්පසු ඔබ විසින් මනාලියගේ සම්පූර්ණ නම කියා ඇය විවාහක භාර්යාව වශයෙන් පිළිගන්නට ඔහු කැමතිදැයි මනාළයාගෙන් විමසන්න.

(iii) මනාළයා " ඔව් " යයි පිළිතුරු දුන් පසු මනාලියට මනාළයාගේ අතින් අල්ලා ගන්නා මෙන් ඉල්ලන්න.

(iv) ඉන්පසු ඔබ විසින් මනාළයාගේ සම්පූර්ණ නම කියා ඔහු විවාහක පුරුෂයා වශයෙන් පිළිගන්නට ඇය කැමති දැයි මනාලිය ගෙන් විමසන්න.

(v) මනාලියගෙන් " ඔව් " යයි පිළිතුරු ලද පසු ඉහත (7) වගන්තියේ (vi) සිට (vii) දක්වා වූ උපදෙස් පිළිපදින්න.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරන්නේ හුදෙක්ම විවාහයක් සිදුකිරීමේ ඇති වටිනාකම මෙන්ම රෙජිස්ට්‍රාර් ධූරයේ ගෞරවය ආරක්ෂා කිරීමේ පරමාර්ථයෙන් බව නැවතත් අවධාරණය කරමි. එබැවින් මෙහි සඳහන් උපදෙස් **සියලුම රෙජිස්ට්‍රාර්වරුන් පිළිපදිනු ඇතැයි උදක්ම බලාපොරොත්තු වෙමි.**

04. මෙම චක්‍රලේඛයේ දෙමළ හා ඉංග්‍රීසි පරිවර්තන යථාකාලයේදී එවනු ලැබේ.

මිහිඳු රත්නායක,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 1. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් | - | දැනගැනීම සඳහා |
| 2. | සියලුම දිස්ත්‍රික් ලේකම් / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත | - | දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 3. | සියලුම ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත | - | දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා(ඔබ ප්‍රදේශයේ සියලුම විවාහ රෙජිස්ට්‍රාර්වරුන් වෙත මෙම චක්‍රලේඛයේ පිටපත් යවනු මැනවි) |
| 4. | සියලුම නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් සහ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත | - | දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |
| 5. | සියලුම ඉඩම් රෙජිස්ට්‍රාර් සහ අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත | - | දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා |